සියලු ම හිමිකම් ඇවිරිණි]
*All Rights Reserved*]

31404

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව/Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, අගෝස්තු 1992
General Certificate of Education (Adv. Level) Examination, August 1992.

| (06) සත්ත්ව විද්‍යාව I<br>(06) ZOOLOGY I | 06<br>S I |
|---|---|

පැ දෙකයි / *Two hours*

උත්තර පත්‍රයේ දක්වා ඇති ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.

මෙම පත්‍රයේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයීමට ඔබ වෑයම් කළ යුතු යි. එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් ඇති නමුදු නිවැරදි පිළිතුර ඉන් එකක් පමණකි. ප්‍රශ්නයට හොඳ ම පිළිතුර හැටියට ඔබ එක් ප්‍රතිචාරයක් තෝරා ගත් පසු එය උත්තර පත්‍රයේ දක්වෙන උපදෙස් පරිදි ලකුණු කරන්න. වඩා පහසු ප්‍රශ්නවලට පළමුවෙන් පිළිතුරු දෙන්න. කිසියම් ප්‍රශ්නයක් අපහසු බව හැඟුණොත් එය මඟ හැර කාලය ඉතිරි වුවහොත් දෙවනුව සලකා බැලීමට කල් තබන්න.

1. කාබන්, පෘථිවියෙහි සජීවී පද්ධතිවල පදනම වී ඇත්තේ
   (1) එය සංයුජතා හතරකින් යුක්ත වන නිසා ය.
   (2) එය දිගු දම සහිත අණු සාදන නිසා ය.
   (3) ප්‍රභාසංශ්ලේෂණය සඳහා $CO_2$ අත්‍යවශ්‍ය වන නිසා ය.
   (4) එය අඩු උෂ්ණත්වයන්හි දී ස්ථායී සංයෝග සාදන නිසා ය.
   (5) එය වෙනත් පරමාණු ගණනාවක් සමඟ සම්බන්ධ වන නිසා ය.

2. ප්‍රෝටීන අණු පෙන්නුම්කරන විශාල විවිධත්වය සම්බන්ධ වන්නේ
   (1) ඇමයිනො අම්ලවල ඇමයිනො කාණ්ඩ වලට ය. (2) ඇමයිනො අම්ල වල R කාණ්ඩ වලට ය.
   (3) පෙප්ටයිඩ බන්ධන තිබීමට ය. (4) ඇමයිනො අම්ල අනුපිළිවෙළයන්ට ය.
   (5) ප්‍රෝටීන අණුවල ත්‍රිමිතික ව්‍යුහයට ය.

3. පහත සඳහන් ඒවා අතරෙන් සෛලප්ලාස්මීය ගලායාමේ දී වැඩිවශයෙන් ම ක්‍රියාකරන්නේ කුමක් ද?
   (1) කණිකාමය ER ය. (2) සිනිඳු ER ය. (3) ප්ලාස්ම පටලය ය.
   (4) කේන්ද්‍ර දේහය ය. (5) ක්ෂුද්‍ර සූත්‍රිකා ය.

4. ලයිසසෝම පිළිබඳ පහත සඳහන් වගන්ති අතරෙන් සත්‍ය නොවන්නේ කුමක් ද? ඒවා
   (1) එන්සයිම ගණනාවක් ගබඩා කරයි. (2) ගොල්ගිවලින් සෑදේ.
   (3) ද්විත්ව පටල ව්‍යුහයන් ය. (4) ප්‍රෝටීන සංශ්ලේෂණයෙහි සහභාගී නො වේ.
   (5) සෛලයෙහි 'දිවිනාශක මලු' ලෙස හඳුන්වනු ලබයි.

5. බහුසෛලික සත්ත්වයකුගේ සියලු ම දෛහික සෛලයන්ට සර්වසම
   (1) අභ්‍යන්තර පරිසර ඇත. (2) බහුවණ්ඩනය වන විලාශ ඇත. (3) පුනර්වර්ධන හැකියාවක් ඇත.
   (4) ඉන්ද්‍රිකා සංඛ්‍යාවක් ඇත. (5) ප්‍රවේණික සංයුතියක් ඇත.

6. පහත සඳහන් වගන්ති අතරෙන් ත්‍රොම්බින් සෛල පිළිබඳව සත්‍ය නොවන්නේ කුමක් ද?
   (1) ඒවා සුදු රුධිරාණු වර්ගයකි. (2) ඒවාට න්‍යෂ්ටි නැත.
   (3) ඒවා රුධිරය කැටිගැසීම සඳහා අත්‍යවශ්‍ය වේ. (4) ඒවාට කෙටි ජීවනකාලයක් ඇත.
   (5) ඒවා රතු රුධිරාණු වලට වඩා සංඛ්‍යාවෙන් අඩු ය.

7. සිනිඳු පේශී ප්‍රධාන පේශී පටක වර්ගය ලෙසට නොපිහිටන්නේ පහත සඳහන් අවයව අතරෙන් කුමන අවයවයෙහි ද?
   (1) දිව (2) මුත්‍රාශය (3) පෙනහැල්ල (4) ආමාශය (5) ධමනිය

8. පහත සඳහන් වගන්ති අතරෙන් කාටිලේජ පිළිබඳ වැරදි වගන්තිය කුමක් ද?
   (1) එය සම්බන්ධක පටක වර්ගයකි. (2) එය වර්ධනය වන්නේ පර්යන්තයෙන් ද්‍රව්‍ය එක්වීමෙන් ය.
   (3) එයට විශේෂ වර්ගයක පූරකයක් ඇත. (4) එහි යුගල වශයෙන් පිහිටන සෛල ඇත.
   (5) පූරකයෙහි රුධිර වාහිනී නොමැත.

9. පුද්ගලයෙකු හදිසියේ භයවූ විට, රුධිරයෙහි වූ හෝර්මෝන සාන්ද්‍රණයෙහි කැපීපෙනෙන වැඩිවීමක් පෙන්නුම් කරන හෝර්මෝනය වන්නේ
   (1) ඇඩ්‍රිනලින් ය. (2) තයිරොක්සින් ය. (3) ඇල්ඩොස්ටෙරෝන් ය.
   (4) රිලැක්සින් ය. (5) ඔක්සිටෝසින් ය.

10. නිශ්චල ව සිටින අලියෙකුට අවශ්‍ය අවම ඔක්සිජන් ප්‍රමාණය වන්නේ පහත සඳහන් ඒවා අතරෙන් කුමක් ද? අගය දී ඇත්තේ $\mu l/g/hr$ වලින් ය.
   (1) 2500. (2) 250 (3) 1250 (4) 148 (5) 500

11. මිනිසාගේ එන්ටෙරොකයිනේස් වල ක්‍රියාව වන්නේ
   (1) ට්‍රිප්සිනොජන් ට්‍රිප්සින් බවට පරිවර්තනය කිරීම ය. (2) කිරි ප්‍රෝටීන කැටිගැසීම ය.
   (3) පෙප්සිනොජන් පෙප්සින් බවට පරිවර්තනය කිරීම ස. (4) අම්ල ස්‍රාවය උත්තේජනය කිරීම ය.
   (5) ප්‍රෝටීන පෙප්ටයිඩ බවට පරිවර්තනය කිරීම ය.

12. පිෂ්ටය මෝල්ටෝස් බවට පරිවර්තනය කරන්නේ පහත සඳහන් එන්සයිම අතරෙන් කුමක් ද?
   (1) මෝල්ටේස් (2) සුක්‍රේස් (3) ඇමයිලේස් (4) රෙනින් (5) ලැක්ටෝස්

[ අනෙක් පිට බලන්න.

13. පහත සඳහන් ඒවා අතරෙන් මිනිස් සමෙහි කෘත්‍යයක් නොවන්නේ කුමක් ද?
(1) ආරක්ෂාව (2) දේහ උෂ්ණත්ව යාමනය (3) උත්තේජන ලබා ගැනීම
(4) විටමින සංශ්ලේෂණය (5) මේද ගබඩා කිරීම

14. මිනිස් වෘක්කාණුවෙහි ග්ලූකෝස් ප්‍රතිශෝෂණය සිදුවන්නේ
(1) අවිදූර සංවලිත නාලිකාවෙහි ය. (2) හෙන්ලේ පුඩුවෙහි අවරෝහණ බාහුවෙහි ය.
(3) හෙන්ලේ පුඩුවෙහි ආරෝහණ බාහුවෙහි ය. (4) විදූර සංවලිත නාලිකාවෙහි ය.
(5) සංග්‍රාහක ප්‍රණාලයෙහි ය.

15. පෝඩොසයිට විශේෂ සෛල කාණ්ඩයකි. ඒවා දක්නට ලැබෙන්නේ
(1) වෘක්කයෙහි ය. (2) ආමාශයෙහි ය. (3) අක්මාවෙහි ය. (4) අන්ත්‍රයෙහි ය. (5) වෘෂණයෙහි ය.

16. පහත සඳහන් වගන්ති අතරෙන් කුකුළු පැටියාගේ භ්‍රෑණ පටල පිළිබඳ සත්‍ය වන්නේ කුමක් ද?
(1) පළමුවෙන් සම්පූර්ණවන භ්‍රෑණ පටලය බීජාන්න මඩිය ය.
(2) අලින්ථය මැදිබඩවැලට විවෘත වේ.
(3) කලලාවාරයෙහි හිස්නැමීම ආරම්භවන්නේ දේහ ප්ලූරාවෙහි නැම්මක් ලෙසට ය.
(4) කෝරියමට ස්වකීය මධ්‍යචර්ම ස්ථරයක් ඇත.
(5) කලලයට නිසියාකාර විකසනය වීම සඳහා භ්‍රෑණ පටල අවශ්‍ය නොවේ.

17. බිජුවෙන් බිහිවන මොංගොතේ ඉස්නඩියා පිළිබඳ පහත සඳහන් වගන්ති අතරෙන් සත්‍ය නොවන්නේ කුමක් ද?
(1) ඌට මුඛයක් නැත. (2) ඌ අන්ධ ය. (3) ඌට බඩවැලක් නැත.
(4) ඌට සංචිත බීජාන්න ඇත. (5) ඌට ආසක්ත ග්‍රන්ථි ඇත.

18. පහත සඳහන් වර්ගීකරණ කාණ්ඩ අතරෙන් එකිනෙකට ඉතා කිට්ටු සාමාන්‍යතාවක් සහිත සත්ත්වයන් අයත් වන්නේ කුමන කාණ්ඩයට ද?
(1) Plylum (2) Sub-species (3) Family (4) Order (5) Species

19. Chordata වන් වෙනත් Plylum එකක් හෝ වැඩි ගණනක් සමඟ පොදුවේ පෙන්නුම් කරන්නේ පහත සඳහන් කුමන ලක්ෂණය ද?
(1) සත්‍ය වෘක්කය (2) උදරීය හෘදය (3) අස්ථිමය හනු
(4) පශ්ච ගුද වලිගය (5) අභ්‍යන්තර සැකිල්ල

20. පහත සඳහන් වගන්ති අතරෙන් වැරදි වගන්තිය කුමක් ද?
(1) Annelida ගේ බහිස්‍රාවී අවයවය වෘක්කිකාව ය.
(2) Platyhelminthes හි නිදැල්ලේ වෙසෙන ආකාරයන්ද අයත් ය.
(3) Nematoda වන්ගේ දේහකුහරය ව්‍යාජ සීලෝමයකි.
(4) විශාලතම අපෘෂ්ඨවංශී සත්ත්වයා දක්නට ලැබෙන්නේ Echinodermata වන් අතරේ ය.
(5) Sporozoa වන්ට අයත්වන්නේ පරපෝෂී සත්ත්වයන් පමණකි.

21. පහත සඳහන් කාණ්ඩ අතරෙන් තම ජීවනචක්‍රය තුළ විවිධ භෝජන විලාස පෙන්නුම් නොකරන සත්ත්වයන් අයත්වන්නේ කුමන කාණ්ඩයට ද?
(1) සමනලයන් (2) පොලිකීටා පණුවන් (3) ක්‍රස්ටේසියාවන් (4) පසැඟිල්ලන් (5) බිම් පණුවන්

22. පහත දක්නට ඇති ලක්ෂණ අතරෙන් සත්ත්ව වංශ වැඩි ම සංඛ්‍යාවක දක්නට ලැබෙන්නේ කුමන ලක්ෂණය ද?
(1) ඛණ්ඩනය (2) අරීය සමමිතිය (3) පක්ෂ්මධර කීටයන් (4) වෘක්කිකා (5) ජලක්ලෝම.

23. විශාල ම විවිධත්වයක් පෙන්නුම් කරන සත්ත්ව Plylum එක වන්නේ
(1) Chordata (2) Mollusca (3) Nematoda (4) Platyhelminthes (5) Arthropoda.

24. මිනිස් පාදයෙහි විශාලතම අස්ථිය වන්නේ
(1) නෞකාකාරය ය. (2) ඝනාභය ය. (3) පාර්ෂ්ණිය ය.
(4) 1 වන කිලරූපී අස්ථිය ය. (5) 2 වන කිලරූපී අස්ථිය ය.

25. මිනිසාගේ මැණික්කටුවෙහි 1 වන හස්තකූර්චෝපරිය සමඟ කෙළින්ම සම්බන්ධවන අස්ථිය වන්නේ
(1) ත්‍රිපිසියම ය. (3) ත්‍රිපිසොයිඩය ය. (3) සශීර්ෂය ය. (4) අකුස් ඇටය ය. (5) වර්තුලාකාරය ය.

26. මිනිස් ආහාර මාර්ගයෙහි පේශී ශ්ලේෂ්මලකය
(1) මස්තු පටලය ළඟින් ම පිහිටයි. (2) ඝන පේශී ස්ථරයකි.
(3) ශ්ලේෂ්මල ස්ථරයෙහි වලනයන් ඇති කිරීමට හේතුකාරක වේ. (4) ආලාර චක්‍ර පිධානය සාදයි.
(5) හොඳින්ම වර්ධනය වී ඇත්තේ අන්නස්‍රෝතයෙහි ය.

27. මිනිස් මොළයෙහි තැලමස පිළිබඳ පහත සඳහන් වගන්ති අතරෙන් සත්‍ය වගන්තිය කුමක් ද?
(1) එය මොළ වෘන්තයේ කොටසකි. (2) එය තෙවන කෝෂිකාව දෙපස පිහිටයි.
(3) එය මධ්‍ය මස්තිෂ්කයෙහි කොටසකි. (4) එය ශ්වේත ද්‍රව්‍යයෙන් පමණක් සමන්විත වේ.
(5) එය පිටියුටරියෙහි කොටසක් සාදයි.

28. මිනිසුන්ගේ ආමාශ-මහාන්ත්‍රික ප්‍රතීකය ක්‍රියාරම්භ කරනුයේ
(1) ආහාර දැකීම මගින් ය. (2) බේට ස්‍රාවය මගින් ය.
(3) ආහාර ආමාශයට ඇතුළුවීම මගින් ය. (4) ආම්ලසය ග්‍රහණියට ඇතුළුවීම මගින් ය.
(5) මහාන්ත්‍රිකයෙහි ක්‍රමාකුංචනය මගින් ය.

29. මිනිසාගේ දෙ පාවෙන් ඇවිදීම සඳහා වැඩියෙන් ම වැදගත්වන්නේ පහත සඳහන් ලක්ෂණ අතරෙන් කුමක් ද?
(1) ඍජු දික් ඌර්වස්ථිය ය. (2) දණහිස් සන්ධියෙහි වූ දණිස් කටුව ය.
(3) ශ්‍රෝණිකෝටරක - ඌර්වස්ථි හිස් සන්ධානය ය. (4) පාදයෙහි චක්‍රතා ය.
(5) පාර්ශ්වික සහ මධ්‍ය මුද්ගරයන් ය.

30. මිනිසාගේ අතිවිශිෂ්ට සාර්ථකත්වයට මූලික වශයෙන් හේතුවන්නේ
(1) අත් පසුර ය. (2) භාවසූචක චින්තනය ය (Abstract thought).
(3) ද්විනේත්‍රික දෘෂ්ටිය ය. (4) ඍජුකාය විලාසය ය.
(5) කථනය ය.

31. ගෙම්බා/මැඩියා ගේ හෘදයෙහි පොදු පුප්ඵුසීය ශිරාව වම් කර්ණිකාවට ඇතුළුවන ස්ථානයෙහි
(1) කපාට නොමැත. (2) සර්පිල කපාටයක් ඇත. (3) ශයිනෝ-කර්ණික කපාටයක් ඇත.
(4) මඩි කපාට ඇත. (5) අඩ සඳ කපාට ඇත.

32. ගෙම්බා/මැඩියා ගේ නවවන කශේරුකාව ඉතිරි කශේරුකාවලින් වෙනස් වන්නේ
(1) එය පුරෝවතල වන බැවින් ය. (2) එය උභයාවතල වන බැවින් ය.
(3) ස්ඵීතවූ ස්නායුමාර්ග කණ්ඨකයක් ඇති බැවින් ය. (4) පුරෝයෝගිවර්ධ නොමැති බැවින් ය.
(5) පශ්චයෝගිවර්ධ නොමැති බැවින් ය.

33. පහත සඳහන් ඒවා අතරෙන් ගෙම්බා/මැඩියා ගේ පිහිනීම හා අඩුවෙන් ම සම්බන්ධ වන්නේ කුමක් ද?
(1) කෙටි මහත පූර්ව ගාත්‍රා. (2) දික් වූ අපර ගාත්‍රා. (3) ශ්ලේෂ්මල ග්‍රන්ථි සහිත සම.
(4) දික් වූ වළලුකර සන්ධිය. (5) ගෙලක් රහිත වීම.

34. ගෙම්බා/මැඩියා ගේ පෘෂ්ඨීය මහා ධමනියෙන් මුලින් ම පැන නගින වාහිනිය වන්නේ
(1) අභ්‍යන්තර ශීර්ෂපෝෂී ධමනිය ය. (2) අධෝක්ෂක ධමනිය ය.
(3) අන්නපෝෂීය ධමනිය ය. (4) සීලියැක් අන්ත්‍රබන්ධන ධමනිය ය.
(5) චර්මීය ධමනිය ය.

35. කැරපොත්තාගේ මුඛ කොටස් පිළිබඳව පහත සඳහන් වගන්ති අතරෙන් සත්‍ය නොවන්නේ කුමක් ද?
(1) අධෝහනු හොඳින් ස්ක්ලෙරටීභවනය වූ දත් දරයි.
(2) ඛෙට ග්‍රන්ථි පූර්වෝෂ්ඨයෙහි ඇතුළ පෘෂ්ඨය මතට විවෘත වේ.
(3) අධරය උප මෙන්ටම මගින් හිසට සවිවී ඇත.
(4) හනුක උපාංගය පුරුක් පහකින් යුත් මඟ දරයි.
(5) ලැසිනියාව දඩි කෙඳි දරයි.

36. කැරපොත්තාගේ පාදය පිළිබඳ ව පහත සඳහන් වගන්ති අතරෙන් සත්‍ය නොවන්නේ කුමක් ද?
(1) එයට ප්‍රධාන ඛණ්ඩ පහක් ඇත. (2) කක්ෂාංගය, ගාත්‍රය උරසට සවි කරයි.
(3) පාදතූර්චය නඛර යුගලක් දරයි. (4) ශක්තිමත්ම ඛණ්ඩය ජංඝාව ය.
(5) ප්‍රසරිකාව කක්ෂාංගය සහ ඌරුව අතර පිහිටයි.

37. කැරපොත්තාගේ ජීරණය ආරම්භ වන්නේ
(1) ආහාරය බඩවැලට ඇතුළු වූ විගසින්ම ය. (2) ගොප්පෙහි ය. (3) ආන්ත්‍රික අන්ධාශ තුළ ය.
(4) පූර්වාමාශය තුළ ය. (5) මධ්‍යාන්ත්‍රිකය තුළ ය.

38. කැරපොත්තාගේ ශ්වසන පද්ධතිය පිළිබඳ පහත සඳහන් වගන්ති අතරෙන් සත්‍ය නොවන්නේ කුමක් ද?
(1) ප්‍රධාන ශ්වාසනාල බඳවල් ශ්වාසරන්ධ්‍ර යුගලයක් මගින් පිටතට විවෘත වේ.
(2) ශ්වාසරන්ධ්‍ර, ඛණ්ඩික ව සැකසී ඇත.
(3) මධ්‍ය උරසෙහි ශ්වාසරන්ධ්‍ර නොමැත.
(4) ශ්වාසනාල ශාඛා ශ්වාසනාල අන්ත සෛල තුළ කෙළවරවෙයි.
(5) ශ්වාසනාල, උච්චර්මයෙන් ආස්තරණය වී ඇත.

39. කිවුල් ජලයෙහි රෝපණය සඳහා භාවිත කරන ලද මත්ස්‍ය ආකාරයක දිගු පෘෂ්ඨීය වරලක් සහ කංකතාභ කොරපොතු තිබුණි. එම මත්ස්‍යයා
(1) සාමාන්‍ය කාපයා ය. (2) තෙල් ගොඩයා ය. (3) ලූලා ය.
(4) තිලාපියා ය. (5) වෙක්කයා ය.

40. දළ වශයෙන් සමාන දිගින් යුත් තිලාපියන් 100ක් විච්ඡේදනය කර විවිධ අවයවයන්හි පිහිටීම සහ ප්‍රමාණය නිරීක්ෂණය කරන ලදී. පහත සඳහන් අවයව අතරෙන් ප්‍රමාණයෙන් වැඩිම වෙනස්කමක් පෙන්විය හැක්කේ කුමන අවයවය ද?
(1) හෘදය. (2) අන්ත්‍රය. (3) අක්මාව. (4) ඩිම්බකෝෂය. (5) ආමාශය.

41. පහත සඳහන් මත්ස්‍ය ආකාර අතරෙන් සාමාන්‍යයෙන් බහුරෝපණයෙහි දී භාවිත **නොකරන්නේ**
(1) තණකොළ කාපයා ය. (2) ලූලා ය. (3) තිලාපියා ය.
(4) වෙක්කයා ය. (5) රිදී කාපයා ය.

42. සමහර කෘමිනාශක වනජීවීන් කෙරෙහි ප්‍රබල තර්ජනයක් වන්නේ
(1) ඒවා ඉතා ස්ථායී සංයෝග නිසා ය. (2) ඒවා අධික සාන්ද්‍රණයන්ගෙන් භාවිත කරන නිසා ය.
(3) ඒවා ආහාර දම ඔස්සේ සාන්ද්‍රණය වන නිසා ය. (4) ඒවා සඳහා ස්වාභාවික වියෝජකයන් නැති නිසා ය.
(5) ඒවා කෘත්‍රිම ද්‍රව්‍යයන් වන නිසා ය.

43. *Nymphula depunctalis* නමැති ගොයම් කොටු පණුවා ගොයම් පැළයට හානි කිරීම නිසා පෙන්නුම් කෙරෙන ප්‍රධාන රෝග ලක්ෂණය නම්
(1) මළ හදවත් ය. (2) සුදු කරල් ය. (3) මැළවී යාම ය. (4) සුදු පුල්ලි ය.
(5) පත්‍ර හෝ පත්‍ර කොටස් නැතිවීම ය.

44. *Oryctes rhinoceros*, කළු පොල් කුරුමිණියා පිළිබඳ **සත්‍ය නොවන්නේ** පහත සඳහන් වගන්ති අතරෙන් කුමක් ද?
(1) කීටයෝ ගොක්කොළ ආහාරයට ගනිති.
(2) සුහුඹුලාගේ හිසෙහි අඟක් ඇත.
(3) ඔවුන්ගෙන් සිදුවන හානිය මේරූ අතුවල දක ගත හැක.
(4) ඔවුන් ගොම ගොඩවල් සහ දිරායන කසළ ගොඩවල් වල බෝවේ.
(5) ඔවුන් සාමාන්‍යයෙන් රෝපණ ක්‍රම මගින් පාලනය කෙරේ.

45. රෝගියකුගෙන් ගන්නා ලද මස්තිෂ්ක - සුෂුම්නා තරලය පරපෝෂිතයන් සිටී දැයි බැලීම සඳහා විශ්ලේෂණය කරන ලදී. පහත සඳහන් පරපෝෂිත යුගලයන් අතරෙන් එම තරලයෙහි තිබිය හැක්කේ කුමක් ද?
(1) *Entamoeba* සහ *Plasmodium*. (2) *Ancylostoma* සහ *Wuchereria* (3) *Entamoeba* සහ *Ancylostoma*
(4) *Plasmodium* සහ *Wuchereria*. (5) *Ancylostoma* සහ *Plasmodium*.

46. මදුරුවකු විසින් කොළඹ නගරය තුළ පුද්ගලයකු දහවල් කාලයේ දී විදින ලදී. ඔහු ආසාදනය වීමට ඉඩ ඇත්තේ
(1) කුන්ද මැලේරියාවෙන් ය. (2) බරවා වලින් ය. (3) ජපාන එන්සෙෆලයිටිස් වලින් ය.
(4) ඩෙංගු වලින් ය. (5) මස්තිෂ්ක මැලේරියාවෙන් ය.

47. පහත සඳහන් ස්ථාන අතරෙන් බරවා පණුවා මගින් සාමාන්‍යයෙන් ආසාදනය වීමට ඉඩ **නොමැත්තේ** මිනිසාගේ කුමන ස්ථානය ද?
(1) වෘෂණ කෝෂ (2) පියයුරු. (3) අත්. (4) පාද. (5) කටවම.

● ප්‍රශ්න අංක 48 — 51 රූපය මත පදනම් වී ඇත.




ගල්පර සහිත මුහුදු වෙරළක් හරහා ඉහළ උදම් මට්ටමේ සිට පහළ උදම් මට්ටම දක්වා A, B, C, D හා E සත්ත්ව විශේෂයන්ගේ අතිබහුලතාව විචලනය වී ඇති ආකාරය රූපයෙන් පෙන්නුම් කෙරේ.

48. තැනින් තැන ව්‍යාප්තියක් පෙන්නුම් කරන්නේ කුමන ප්‍රස්තාරය ද?
(1) A (2) B (3) C (4) D (5) E

49. විජලනය සඳහා වැඩියෙන්ම මුහුණ දියහැකි විශේෂය පෙන්වන්නේ කුමන ප්‍රස්තාරය ද?
(1) A (2) B (3) C (4) D (5) E

50. A ප්‍රස්තාරයෙන් නිරූපණය කෙරෙන්නේ පහත සඳහන් ඒවායින් කුමක් ද?
(1) ලිටෝරිනාවන් (2) සාවාටින් (3) මුහුදු ඇනිමෝනියාවන් (4) අවපියල්ලන් (5) පසැඟිල්ලන්

51. විශාල වශයෙන් මුහුදු ඉකිරියන් සිටිනා වෙරළක ඔවුන්ගේ ව්‍යාප්තිය පෙන්නුම් කරන්නේ කුමන ප්‍රස්තාරය ද?
(1) A (2) B (3) C (4) D (5) E

52. ආවේණිය පිළිබඳව වැඩියෙන්ම මූලික වන්නේ පහත සඳහන් මත අතරෙන් කුමක් ද?
(1) එක සාධකයක් ප්‍රමුඛ ද, අනෙක නිලීන ද විය හැකි ය.
(2) ප්‍රවේණිය අසන්තත සාධක මත පදනම් වී ඇත.
(3) ප්‍රභේදනයෙහි පදනම විකෘති ය.
(4) සත්ත්ව සහ ශාක යන දෙකොටසට ම එකම මූලධර්ම යෙදෙයි.
(5) සාධක සසම්භාවීලෙස සංරචනය වේ.

53. මිනිසාගේ දුඹුරු ඇස් නිල් ඇස්වලට ප්‍රමුඛ වේ. නිල් ඇස් ඇති මවකගේ දුඹුරු ඇස් සහිත පුතෙක් නිල් ඇස් සහිත ස්ත්‍රියක විවාහ කර ගනියි. ඔවුන්ගේ ජනිතයන් දක්වන දුඹුරු : නිල් ඇස් වල අනුපාතය
(1) 3 : 1 වේ. (2) 1 : 3 වේ. (3) 1 : 1 වේ. (4) 0 : 1 වේ. (5) 1 : 0 වේ.

54. පහත සඳහන් ඒවා අතරෙන් පරිණාමය සඳහා සම්පූර්ණයෙන් ම අත්‍යවශ්‍ය වන්නේ
(1) විකෘතිය ය. (2) තරගය ය. (3) අධි නිෂ්පාදනය ය.
(4) පාරිසරික වෙනස්වීම් ය. (5) අනුවර්තනය ය.

55. සෑම ගහනයකම පරිණාමය සඳහා තිබීම අවශ්‍ය වන්නේ
(1) ප්‍රමුඛ ලක්ෂණ ය. (2) නිලීන ලක්ෂණ ය. (3) ප්‍රවේණික ප්‍රභේදන ය.
(4) සසම්භාවී සංවාසය ය. (5) කලහකාරී වයසිව ය.

56. පහත සඳහන් වගන්ති අතරෙන් ඕසෝන් ස්ථරය පිළිබඳ සත්‍ය නොවන්නේ කුමක් ද?
(1) එය වායුගෝලයෙහි ස්වාභාවික කොටසකි.
(2) එය සූර්යයාගෙන් එන UV කිරණ වලට බාධකයක් ලෙසට ක්‍රියාකරයි.
(3) CFC භාවිතය නැවතුවහොත් වසර 2ක් හෝ 3ක් ඇතුළත ඕසෝන අඩුවීම නැවැත්විය හැකි ය.
(4) එය 15 — 30 km අතර උසකින් පිහිටයි.
(5) ඕසෝන් හරිතාගාර වායුවකි.

57. ජෛව විවිධත්වය ආරක්ෂා කර ගත යුතු වීමට ප්‍රධාන හේතුව වන්නේ
(1) එය නැතිවුවහොත් ප්‍රතිස්ථාපනය කළ නොහැකි නිසා ය.
(2) එය නැතිනම් පෘථිවිය විනාශවී යන නිසා ය.
(3) විවිධ ජීවී - පද්ධති වලට පදනම එය වන නිසා ය.
(4) මිනිසාට අවශ්‍ය රසායනික ද්‍රව්‍ය ගණනාවක් එහි අඩංගුවිය හැකි නිසා ය.
(5) සියලු ම ජීවීන් එයට ඇතුළත් වන නිසා ය.

58. ජීව විද්‍යාවේ වැඩිම දියුණුවකට තුඩු දුන්නේ පහත සඳහන් සොයාගැනීම් අතරෙන් කුමක් ද?
(1) විකෘතිකාරක මගින් විකෘති ජනනය කළ හැකි ය. (2) DNA ද්විත්ව හෙලික්සයකි.
(3) සඳමත ජීවීන් ඇති බවට සලකුණු නැත. (4) ප්ලාස්ම පටලයට තරල විචිත්‍ර ව්‍යුහයක් ඇත.
(5) 'ලුසි' යන ආරූඪ නාමයෙන් හැඳින්වෙන පොසිලය සත්‍ය ගෙදාවන් බව පෙන්වූවකි.

59. පාරිසරික විද්‍යාඥයන් විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් අදහස් අතරෙන් සත්‍ය නොවන්නේ කුමක් ද?
මිනිසා
(1) පෘථිවියෙහි පරිසරය වෙනස් කරයි. (2) පෘථිවිය විනාශ කරයි.
(3) පෘථිවිය මානව උන්නතිය සඳහා නුසුදුසු කරයි. (4) විශේෂයන්ගේ නැතිවියාම වේගවත් කරයි.
(5) පොසිල ඉන්ධන සංචිතයන් හිස් කරයි.

60. පහත සඳහන් පුද්ගලයන් අතරෙන් ජීවයේ සම්භවය පිළිබඳ වූ වාද හා සම්බන්ධ වන්නේ කවරෙක් ද?
(1) Hardy (2) Haldane (3) Morgan (4) Nicholson (5) de Vries